**එම්. යූ. එම්. අලි සබ්රි, පා.ම.**
எம்.யூ.எம். அலி ஸப்ரி, பா.உ
M.U.M. Ali Sabry, PC, MP
**විදේශ කටයුතු අමාත්‍ය**
வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்
Minister of Foreign Affairs

## <u>නිදහස් දින පණිවුඩය</u>

මීට වසර 75 කට පෙර, සියවස් පහකට ආසන්න යුරෝපීය යටත් විජිත පාලනයෙන් අනතුරුව, 1948 පෙබරවාරි මස 4 වැනි දින ශ්‍රී ලංකාව අභිමානවත් ස්වෛරී ජාතියක් ලෙස නිදහස ලබා ගත්තේය. එයින් ටික කලකට පසුව, රාජ්‍යයන්ගේ ස්වෛරී සමානාත්මතාවයේ මූලධර්මය මත පිහිටුවන ලද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රාජ්‍යයක් ලෙස අපි ජාත්‍යන්තර ප්‍රජාවට ඇතුළු වූයෙමු.

නිදහස ලැබීමෙන් පසුව එළැඹුණු මුල් වසරවල දී, අලුතින් ස්වාධීන බවට පත්වූ රටවල අභිලාෂයන් සහ ප්‍රමුඛතාවන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයෝ ජාත්‍යන්තර වේදිකාවල දී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළහ. කොළඹ ක්‍රමය, කොළඹ බලවතුන්, බැන්ඩුන්ග් සමුළුව සහ පොදුරාජ්‍ය මණ්ඩලය හරහා ජාතියේ පියා ලෙස හැඳින්වුණු මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා ඇතුළු අපගේ නායකයින් ජාත්‍යන්තර සන්ධාන ඇති කර ගැනීමට සහ කලාපීය සහයෝගීතාවය ශක්තිමත් කිරීම සඳහා එක්විය. ලොව ප්‍රථම කාන්තා අගමැතිනිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකාව නොබැඳි ව්‍යාපාරයේ ප්‍රමුඛස්ථානයට එළැඹි අතර, එහිදී ආසියාවේ සහ අප්‍රිකාවේ අලුතින් සංවර්ධනය වෙමින් පවතින අනෙකුත් ජාතීන් සමඟ සහයෝගීතාවයෙන් යුතුව, ස්වයං නිර්ණය, සමානාත්මතාවය සහ ජාත්‍යන්තර කටයුතුවල දී යුක්තිය වෙනුවෙන් නැගී සිටියේය.

විශ්ව සෞඛ්‍ය සේවාව සහ නිදහස් අධ්‍යාපනය ලබා දීම හරහා, පසුගිය වසර 75 තුළ දී අපගේ ජනතාවගේ සාක්ෂරතාවය, ජීවන තත්ත්වය සහ යහපැවැත්ම ඉහළ නැංවීම සම්බන්ධයෙන් අපි විශාල ප්‍රගතියක් අත්කර ගෙන ඇත්තෙමු. එමෙන්ම අප විසින් ජාතිය සුරක්ෂිත කොට, ජාතික ආරක්ෂාවට එල්ල වූ ත්‍රස්තවාදී බෙදුම්වාදී තර්ජන ජයගෙන ඇත. එසේ වුවද, වඩාත් හොඳින් ඉටු කළ හැකිව තිබූ කරුණු පිළිබඳව අප යථාර්ථවාදීව සලකා බැලිය යුතුය. ජාතිය ගොඩනැගීම, සංහිඳියාව, එකම ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් තුළින් ජාතික සමගිය ඇති කිරීම සහ ඔරොත්තු දෙන, තිරසාර, අපනයනය ඉලක්ක කරගත් ආර්ථිකයක් ගොඩනැගීම යන ක්ෂේත්‍ර තුළ අපට අත්කර ගැනීම සඳහා බොහෝ දේ ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, අපි අවංකව මෙනෙහි කර සමාලෝචනය කළ යුතු වනවා මෙන්ම, ඉදිරිය ද සැලසුම් කළ යුතුය.

කාර්යාලය/அலுவலகம்/Office: +94-11-2430221, +94-11-2445498 ෆැක්ස්/பெக்ஸ்/Fax No. : +94-11-2430222
වෙබ් අඩවිය/வலைத்தளம்/Website: www.mfa.gov.lk - ඊමේල්/மின்னஞ்சல்/Email: fmo@mfa.gov.lk
විදේශ කටයුතු අමාත්‍යාංශය, ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01, ශ්‍රී ලංකාව
வெளிநாட்டு அலுவல்கள் அமைச்சு, குடியரசுக் கட்டிடம், கொழும்பு 01, இலங்கை.
Ministry of Foreign Affairs, Republic Building, Colombo 01, Sri Lanka.

වර්තමානයේ දී, ශක්තිමත් කරන ලද ප්‍රජාතන්ත්‍රවාදී රජය, සංහිඳියාව, ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය තුළින් පෙර නොවූ විරූ සමාජ හා ආර්ථික අභියෝගවලට මුහුණ දීම පිණිස ශ්‍රී ලාංකිකයෝ එක්සත් ප්‍රයත්නයක් සඳහා එක්ව නැඟී සිටිති. අපගේ සමාජයේ සියලුම අංශවල සංවර්ධනය සහ ප්‍රගතිය සඳහා වන අවස්ථාවන් උපරිම කිරීම සඳහා විදේශ අමාත්‍යාංශය සිය රාජ්‍යතාන්ත්‍රික ප්‍රයත්නයන් කෙරෙහි අවධානය යොමු කරනු ඇත. මෙම ජාතික ප්‍රමුඛතා සඳහා ජාත්‍යන්තර සහය ලබා ගැනීම සඳහා මෙම අමාත්‍යාංශය සහ එහි එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල ජාලය කැපවී සිටී. විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ සැලකිය යුතු දායකත්වය අපි හඳුනාගන්නා අතර, ඔවුන්ගේ අඛණ්ඩ නියැලීම සාදරයෙන් පිළිගනිමු.

අපගේ 75 වැනි නිදහස් සංවත්සරයේ දී, අප හට අවස්ථාවක් පිරිනමනු ලැබ ඇත. එය සමගිය, ප්‍රතිසන්ධානය, ජනවාර්ගික සහජීවනය ශක්තිමත් කිරීම සහ යහපත් ආර්ථික කළමනාකරණයක්, ප්‍රකෘතිමත් වීම සහ අනාගත වර්ධනය සඳහා ස්ථාවර පදනමක් ගොඩනැගීම පිණිස ජනප්‍රියවාදී ප්‍රතිපත්තිවලින් තොර වූ පරිසරයක් සඳහා වන අවස්ථාවකි. එය අප අතර පවතින වෙනස්කම් පසෙක තබා, අපගේ ජාතියට සාර්ථකත්වය, සෞභාග්‍යය සහ දීප්තිමත් අනාගතයක් සඳහා වූ අපේක්ෂාව සමඟ නැවත ගොඩනැගීම සහ අලුත් කිරීම සඳහා ලැබෙන අවස්ථාවකි. එය අත්පත් කර ගැනීම සඳහා වන අපගේ කැපවීම තුළ අපි අධිෂ්ඨානශීලී විය යුතුය.

මෙම තීරණාත්මක ප්‍රයත්නය සඳහා අප සමඟ එක්වන ලෙස අපි ලොව පුරා වෙසෙන ශ්‍රී ලාංකිකයින්ට ආරාධනා කරමු.

**එම්.යූ.එම්. අලි සබ්රි, ජනාධිපති නීතිඥ, පා.ම.**
විදේශ කටයුතු අමාත්‍ය

2023 පෙබරවාරි 4 වැනි දින